# රජරට සේවා නාට්‍ය කලා ප්‍රතිභා

සමාජ සන්නිවේදනාත්මක පර්යේෂණ අධ්‍යයනය



## සේන නානායක්කාර

54
N

33242
PL.
LIBRARY * RAJARATA UNIVERSITY OF SRI LANKA * MIHINTALE
LN
Koha LIBRARY SYSTEM

# රජරට සේවා නාට්‍ය කලා සමීක්ෂා

RAJMNLIB
33242

සේන නානායක්කාර
B. A. (ගෞරව),M . A. (ලංකා)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
මිහින්තලේ.

| ප්‍රවේශ අංකය | 33242 |
|---|---|
| වර්ග අංකය | 384 . 54 NAN |

එස්. ගොඩගේ සහ සහෝදරයෝ
නො: 6 75 ,
පී.ද.එස්. කුලරත්න මාවත,
කොළඹ - 10

## පිවිසුම

ගුවන්විදුලිය වූ කලී සමස්ත විශ්වයම අඳුරු සැනෙකින් මිනිස් මනසට ප්‍රවිශ්ට කරවිය හැකි විශ්මයජනක මෙවලමකි. විශ්වයේ ඉම හඹා යන්නටත්, එහි පතුල විනිවිද දකින්නටත් ඊට ඇති හැකියාව සුළුපටු නොවේ. එකී ආශ්චර්යවත් ශක්‍යතාව ප්‍රකට කරන්නට උපයෝගී කරගනු ලබනුයේ ශබ්දය, හඬ හා වචනය මුල්කොට ගත් සංවිධිත භාෂාවයි. එකී භාෂාවේ ඇති ධ්වනි ශක්තිය හෙවත් අනුකර්ෂණ බලය විසින් උත්පාදනය කෙරෙන අර්ථ සම්පන්න පරිකල්පනය මිනිසාගේ චක්ෂුඥාණමය ලෝකය පුළුල් කරයි. ගුවන්විදුලිය මාධ්‍යය ලබා ඇති විශිෂ්ටතම ජයග්‍රහණය එයයි. එබැවින්ම, මෙය අද වන විට මානවයා සතුව පවත්නා ඉතා සරල, සියුම් මෙන්ම වඩාත් බලසම්පන්නතම සන්නිවේදන මාධ්‍යයක් වෙයි.

එසේනම්, එහිම අනුකාරක මාධ්‍ය විශේෂාංගයක් වන ගුවන් විදුලි නාට්‍යයට එබඳු ශක්‍යතා අමුතුවෙන් ආරෝපණය කළ යුතු නොවන බව කීම අතිශයෝක්තියක් නොවේ. හුදෙක්, සරල විනෝදාස්වාදය පමණක් නොව එයින් ගොඩනැගෙන සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතිකමය ආකල්ප සමුදාය මෙහිදී වඩාත් වැදගත්ය. ස්වකීය ජීවන ප්‍රගමනයන්ට දායකත්වය සපයන එකී නාට්‍යමය අත්දකීම් පද්ධතිය, ඔවුන් ලබන ඥානමය හා භාවමය සම්පත් වෙයි. මෙය පර්යේෂණ කටයුතු විෂය ප්‍රපංචයකි. මන්ද, ක්‍රියාදාමයක් වශයෙන් ගත්කල එය වඩාත් සංකීර්ණ වුත්, පෘතුල වුත් කාර්යභාරයක් වන බැවිනි.

ගුවන්විදුලි නාට්‍ය මාධ්‍ය හා ග්‍රාහක ජීවන රටාවට ඉන් ඇති කෙරෙන බලපෑම පිලිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක ඇති වැදගත්කම හෙළි කෙරෙනුයේ යට කී කරුණු අනුවයි. ඉහුදු රජරට සේවා නාට්‍ය හා හාත්පස ග්‍රාහක ජීවන රටාවට ඉන් කෙරෙන බලපෑම සමාජ සන්නිවේදනාත්මක දෘෂ්ටි කෝණයකින් විමසා බැලීම එහි වැදගත් කම සුවිශේෂයෙන් පැහැදිලි කරයි. එනම්, අද අපත්, අපගේ අසල්වැසියාත් මුහුණ

දී සිටින වඩාත් ප්‍රබලතම අභියෝගය සංවර්ධන ගැටලුව වන නිසාත්, ඊට උචිතම විසඳුම් ක්‍රියාමාර්ගයන් යෝජනා කළ හැක්කේ අපේම සම්පත් හා හැකියාවන් ඔස්සේ වන නිසාත්ය.

රජරට සේවා නාට්‍යයම මෙකී සමීක්ෂාවට ප්‍රස්තුත කොට ගත්තේ එබැවිනි. මෙය දැනට වසර කීපයකට පෙර සිට මා විසින් දියත් කරනු ලැබූ සමීක්ෂණ කාර්යයක ප්‍රතිඵලයක් වන බැවින් මේ වන විට මෙකී සමස්තය තුළ යම් යම් වෙනස්කම් හෝ පරස්පරයන් දකිය හැකි බව මම සිතමි. නමුත්, කවදා හෝ අපි අපේ ප්‍රබලතා මෙන්ම දුබලතා ද හඳුනාගත යුතුයි. විවිධ අඩු ලුහුඬුතා ඇතිව හෝ එකී සද්කාර්යයට සමාජය ප්‍රවිශ්ට කරවීමේ පිවිතුරු චේතනාව ම මීට හේතු කාරක විය.

මෙම පර්යේෂණ අධ්‍යයනය සිදු කිරීමෙහිලා මා පොළඹවා ලූ කැලණිය විශ්ව විද්‍යාලයීය මාධ්‍ය පර්යේෂණ විෂය විද්‍යාර්ථී සමූහයා දයාවෙන් යුතුව සිහිපත් කරමි. එවකට "යොස්කා" (YOSCAR) සංවිධානයේ පර්යේෂණ උපදේශකවරයකු ලෙස ඔවුන් හා යම් යම් කාර්යයන් හි නියැලෙද්දී මෙබඳු කටයුත්තක අවශ්‍යතාව මට තව තවත් තදින් දැනිණි. පර්යේෂණ අධ්‍යයනයක ප්‍රධාන කොට ගැනෙන විෂය ක්ෂේත්‍රය, දත්ත ගවේෂණය, දත්ත විග්‍රහය, හා නිගමන ලබාදීම මෙන්ම අදාල ගැටලුව විසඳීමෙහිලා වඩාත් ඵලදායී යෝජනා ඉදිරිපත් කිරීම යනාදී ශීර්ෂයන් ඔස්සේ ඔවුන්ගෙන් නිරතුරුව නැගෙන ප්‍රශ්නාවලීන්ට සරල පිළිතුරු මේ තුළින් සැපයෙනු ඇතැයි මම විශ්වාස කරමි. මේ සම්බන්ධයෙන් ඔවුන් තුළ වූ කුහුල හා කුතුහලයම මා උනන්දුව දල්වාලන්නට හේතු වූ බැව් සඳහන් කරමි.

ඒ හැර, මෙකී පර්යේෂණ අධ්‍යයනය කෙරෙහිලා ගුරුපදේශ සපයමින් මා දිරිමත් කළ ආචාර්ය නන්දන කරුණානායකයන් ටත්, සුගතපාල ද සිල්වා සූරීන්ට,එස්. ගොඩගේ සහෘදයාණන්ට හා බොරලැස්ගමුව රන්ජිත් ග්‍රැෆික්ස් හි කාර්ය මණ්ඩලයට මෙන්ම මෙහි සාර්ථකත්වයෙහිලා මාර්ගෝපදේශකත්වය සපයමින් මට උපකාර කළ අනුරාධපුර පොතානේගම ග්‍රාම නිලධාරී හේරත් එප්පාවල සොහොයුරාටත්, මගේ ආදරණීය සුද්දිටත් පිං.

සේන නානායක්කාර

මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.

| පියවර | පිටුව |
|---|---|

පිදුම
පිවිසුම
පියවර

01. පළමුවන පරිච්ඡේදය - සැලසුම්කරණය 11-21
    1.1 හැඳින්වීම
    1.2 පර්යේෂණ අරමුණු
    1.3 පර්යේෂණ ක්‍රමවේදය
    1.4 පර්යේෂණ ගැටලු

02. දෙවන පරිච්ඡේදය - රජරට සේවා ශ්‍රවණකලාපීය ජීවභාවය හා නාට්‍ය වැඩසටහන් 22-34
    2.1 ආර්ථික කටයුතු
    2.2 වෘත්තීය කටයුතු
    2.3 අධ්‍යාපන කටයුතු
    2.4 නාට්‍ය වැඩසටහන් සැලසුම්

03. තුන්වන පරිච්ඡේදය - අධ්‍යයන ක්ෂේත්‍රයෙහි සමාජ ආර්ථික ජීවන රටාව පිළිබඳ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු 35-52
    3.1 හැඳින්වීම
    3.2 ඓතිහාසිකත්වය
    3.3 පිහිටීම හා භූ ලක්ෂණ
    3.4 ඇදහිලි, විශ්වාසයන් හා ජනශ්‍රැතීන්
    3.5 ගැමි තාක්ෂණය
    3.6 සන්නිවේදන විධි
    3.7 පරිවහන හා ගමනා ගමන කටයුතු
    3.8 රැකියා හා ජීවනෝපාය කටයුතු
    3.9 වර්තමාන ප්‍රජා තොරතුරු

04. හතරවන පරිච්ඡේදය-ක්ෂෙත්‍ර අධ්‍යයනය 53-91

රජරටසේවා ගුවන්විදුලි නාට්‍ය, සිය ග්‍රාහක ජීවන රටාවට කරනු ලබන බලපෑම.
(අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල, නල්ලමුදාව ගම්මානය ඇසුරෙන් සිදුකෙරෙන සමාජ සන්නිවේදනාත්මක සමීක්ෂණය)

05. පස්වන පරිච්ඡේදය-සමාලෝචනය, නිගමන හා නවයෝජනා 92-106

5.1 සමාලෝචනය
5.2 නිගමන
5.3 නව යෝජනා

උපග්‍රන්ථය 1 -රජරටසේවා ශ්‍රවණකලාපිය සිතියම 107
උපග්‍රන්ථය 11 -පර්යේෂණාත්මක ප්‍රශ්නාවලිය 108-114
උපග්‍රන්ථය 111 -ශ්‍රාවක ප්‍රතිචාර - කංචුක චිත්‍ර 115-117